VIDUS 2-4-9

# නව ආර්ථික ප්‍රතිපත්තියේ අංගයක් වශයෙන් අපනයන පිරි සැකසුම් කලාපයට හිමිතැන


එච්. එන්. එස්. කරුණාතිලක

නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව


අපනයන පිරි සැකසුම් කලාපයක් පිහිටුවීම සඳහා කර ඇති යෝජනාවෙහි යෝග්‍යතාවය හා ජාතික ප්‍රතිලාභ හැරුණුවිට, ආර්ථික ප්‍රතිපත්තියෙහි විෂය ප්‍රමාණය හා අරමුණු පිළිබඳ සැලකිය යුතු වෙනසියාවක සංකේතයක් වශයෙන්ද එය පවතී. මීට කලින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය විසින්ද ශ්‍රී ලංකාවේ අපනයන පිරි සැකසුම් කලාපයක් පිහිටුවීමට අදහස් කරන ලදී. දැඩි පාලන විධිවිධාන සහිත ආර්ථික රාමුවක් ඇතුලත පවා මෙබඳු යෝජනාවක් සලකා බැලීමෙන් පෙනීයන්නේ දැඩි සීමා සහ රජයේ පාලනය යටතේ ගෙන ගිය ආර්ථික ප්‍රතිපත්තිය මුළුමනින්ම අසාර්ථක වූ බව එම රජය පිළිගත්තාසේය. වර්තමාන රජයේ නව ආර්ථික ප්‍රතිපත්තිය දෙස බැලිය යුත්තේ 1956 වසරේ සිට පිළිවෙලින් පැවත ආ ආණ්ඩුවල ප්‍රතිපත්ති අනුව හා අද පවතින තත්ත්වය යටතේ උපාය මාර්ග සියල්ලක්ම අභිනව දිශාවකට අවනත කිරීමේ අවශ්‍යතාවයද අනුවය. 1970 ට පසුව ආර්ථිකය ඉතා දරදඬු ස්වභාවයකට පත්වූ අතර, දේශීය හා විදේශීය ආයෝජනයට ඉතා අහිතකර වාතාවරණයක් ඇතිවිය. ආර්ථිකය දුර්වල කිරීමට තුඩුදුන් අන්තර් නමාඃ ප්‍රතිපත්ති හා හැම අංශයකම විහිදී ගිය සීමා කිරීම්ද පනවා තිබුණේය.

## දැඩි පාලන ක්‍රම ඇති කිරීම

දෙවන ලෝක සංග්‍රාමයෙන් ශ්‍රී ලංකාවට පාලන ක්‍රම පද්ධතියක් උරුම වූ අතර එම කාලයේ පටන්ම ශුභ සාධන වියදම් රාශියක් සඳහා මුදල් වැය කිරීමටද සිදුවී ඇත. මේවා පසුගිය දශක දෙක ඇතුලතදී ශීඝ්‍ර සංවර්ධනය ඉදිරියේ ප්‍රධානතම බාධක වශයෙන් පැවති අතර ඇතැම් අංශ මුළුමනින්ම වාගේ අකර්මන්‍ය වීමට හා ආර්ථික සංවර්ධනය ගැන අන්තර් නම්‍ය ආකල්පයකින් කටයුතු කිරීමටද හේතු විය. විදේශ විනිමය පාලන රෙගුලාසි යුද්ධ කාලය තුල පනවන ලද ඉතා වැදගත් සීමාකිරීම් විය. යුද්ධය අවසන්වූවාට පසුවද විදේශීය විනිමය ඉතිරිකරගැනීමේ පරමාර්ථය ඇතිව මෙම සීමාකිරීම් තවදුරටත් එලෙසම පවත්වාගෙන යන ලදී. විදේශීය වෙළඳාම ලාංකික කිරීමේ අදහස ඇතිව 1950 ස් ගණන්වලදී ආනයන සීමාකිරීම් ආරම්භ කිරීමෙන් පසුව ප්‍රධාන වශයෙන් බලපත් නිකුත් කරනු ලැබුයේ ලාංකික වෙළඳුන්ට හා ලාංකික සමාගම්වලටය. 1960 ට පසුව දැඩි සීමාකිරීම් පැනවීමෙන්, ගෙවුම් ශේෂ තත්ත්වය වර්ධනය කරගැනීමට හා කර්මාන්තවල ආයෝජනය වැඩිකර ගැනීමටත් හැකිවේ යයි පාලකයෝ විශ්වාස කළහ. විදේශ ධනය උපයාගත හැක්කේ අපනයන විවිධාංගී කරණය මගින් හා විදේශ ආයෝජන පොළඹවා ගැනීමෙන් නොව පවත්නා අපනයනවලින් හා ආනයන කපාහැරීමෙන්ය යන මතය ඇතිවීමට හේතුවූයේ එකල පැවති යල් පැනගිය ගෙවුම් ශේෂ පිළිබඳ සංකල්පය නිසයි.

පණස් ගණන්වල මුල් අවධියේ පැවති ලිහිල්වූ හා නිර්බාධ ආර්ථිකය වෙනුවට දැඩි සීමාකිරීම් සහිත ආර්ථිකයක් බිහිවිය. විදේශ ධන සංචිත ක්ෂය වෙමින් පවතින අවස්ථාවලදී කළ යුත්තේ සීමාකිරීම් පැනවීම නොව විදේශ ආයෝජන පොළඹවා ගැනීම බව පාලක පක්ෂයට නොවැටහිණ. ආර්ථිකය තුළ එතරම් සීමා කිරීම් නොවිණි නම් හා ජාතියෙහි ආර්ථික දේහය පාලනය කිරීමට රජය ඉදිරිපත් නොවිණි නම් ශ්‍රී ලංකාවේ සංවර්ධන කාර්යාවලිය මීට වඩා වෙනස් මාර්ගයක් ගැනීමට ඉඩ තිබිණි. විශේෂයෙන් දේශීය හා විදේශීය ව්‍යවසායයන් ජනසතු කිරීමේ ප්‍රතිපත්තිය හේතු කොටගෙන ආයෝජන සඳහා පැවති ආර්ථික වාතාවරණය අහිතකර වූ බැවින් 1956 ට පසු විදේශීය ආයෝජකයෝ මෙරටින් ඈත් වූහ. ආර්ථිකය විවිධාංගීකරණය සඳහාද එය අපනයනයට නැඹුරු කිරීම සඳහාද පියවර ගතහැක්කේ දැඩි පාලනයක් යටතේ නොව නීතිරීති ලිහිල් කළ වාතාවරණයක් යටතේය.

නිදහස් වෙළඳ කලාපයක් පිහිටුවීමේ යෝජනාව අගැයුම් කළ යුත්තේ අපනයන විවිධාංගීකරණයට හා අනුබල දීමට මෙන්ම දේශීය කර්මාන්ත සඳහා එතෙර වෙළඳපොලෙහි තැනක් ලබා ගැනීමටද ඇති ඉඩකඩ අනුසාරයෙනි. පසුගිය වසර දහහත ඇතුලත දී ශ්‍රී ලංකාවේ සංවර්ධනය බෙහෙවින් කර්මාන්ත අංශයට නැඹුරුවී ඇත. කෘෂිකර්මයෙහි සැලකිය යුතු ප්‍රගතියක් දක්නට තිබුණද ප්‍රධාන ක්‍රම සම්පාදකයෝ නගරබද්ව අලුතින් පිහිටුවන ලද කර්මාන්තශාලාවල ශුභ සාධනය පිළිබඳව වඩා සැලකිලිමත් වූහ. ආරම්භයේ පටන් ඔවුනට අයබදු හා වෙනත් දිරිගැන්වීම් පිරිනමන ලදී. විවිධ ප්‍රමාණයෙන් යුතු නව කර්මාන්ත 2500 ක් පමණ ඇතත් මේවායින් වැඩි ගණනක්ම පවත්වාගෙන එන ලද්දේ අභ්‍යන්තර වෙළඳ පොළෙහි ඔවුන්ට ලබාදී තිබුණ දැඩි ආරක්ෂාව හේතුකොට ගෙනය. දැඩි ආරක්ෂාව සලසන තීරුබදු හා විදේශික වෙළඳ තරඟයෙන් ඔවුන් මුළුමනින්ම ආරක්ෂා කෙරුණු නිසා දේශීය විකුණුම් ඉතා ලාභදායක වී ඇත.

## අපනයන වැඩ කටයුතු

සුරක්ෂිත වෙළඳ පොලක, භාණ්ඩ විරලවූ අවස්ථා යටතේ කර්මාන්ත කරුවෝ භාණ්ඩයක විකුණුම් මිල, ලාභාන්තය හා සිය නිෂ්පාදන වල තත්ත්වය පවා නිර්ණය කරති. විවිහිය, පරිවර්ත්‍ය රුපියල් ගිණුම්, අමුද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ සඳහා අඩු තීරුබදු, අපනයන භාණ්ඩ වෙනුවෙන් බදු සහන හා නොමසුරු ලෙස විදේශීය විනිමය වෙන්කරදීම් බඳුවූ කොතෙකුත් දිරිගැන්වීම් තිබුණද ශ්‍රී ලංකාවේ කර්මාන්තකරුවන් වැඩි දෙනෙක්ම භාණ්ඩ අපනයනය කිරීමට සමත්වී නැත. අපනයන සංවර්ධන කාර්යාංශය වැනි විශේෂඥ ආයතන පිහිටුවීමෙන් පවා ශ්‍රී ලංකාවේ අපනයන කටයුතුවල එතරම් වෙනසක් සිදුවී ඇති බවක් නොපෙනේ. කාර්මික හා නිෂ්පාදිත භාණ්ඩවල අපනයන සංඛ්‍යා අනුව පෙනීයන කරුණක් නම් මෙම අංශයේ ඉපැයුම්වලින් වැඩි කොටසක්ම ලැබී ඇත්තේ පිරිපහදු ඛනිජ තෙල් නිෂ්පාදන ද්‍රව්‍යවලින් වන බවය. 1976 නිෂ්පාදිත අපනයනයන්ගෙන් ලැබුණු රු. දශලක්ෂ 755.7 ක මුළු ඉපයුම්වලින් රු. දශලක්ෂ 505.2 ක්ම ලැබී ඇත්තේ ඛනිජ තෙල් නිෂ්පාදන ද්‍රව්‍යවලිනි. නිෂ්පාදකයන් රු. දශලක්ෂ 250.5 ක් පමණ උපයාගත් අතර එය මුළු අපනයන වටිනා කමෙන් 5% ක් වන අතර කාර්මික භාණ්ඩ අපනයනය කිරීමෙන් ලබාගත් ආදයමෙන් 30% ක් පමණි. භාණ්ඩ අපනයන කටයුතුවල නිෂ්පාදකයන් සාපේක්ෂක වශයෙන් බලන කල උදාසීන වීමට හේතුවූ සාධක කිහිපයකි. නිෂ්පාදනවල තත්ත්වය විදේශීය ගැනුම් කරුවන්ගේ නියම අවශ්‍යතාවලට අනුකූල නොවූ බැවින් නිෂ්පාදක යන්ට අපනයන ඇණවුම් පවත්වාගෙන යාම ලෙහෙසි පහසු කාර්ය යක් නොවිය. ස්ථාපිත වෙළඳ පොලවල් ඇති පිළිගත් ජාත්‍යන්තර සමාගම් සමග සම්බන්ධතා ඇතිකරගෙන ජනප්‍රිය වෙළඳ නාම යටතේ ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි නොකිරීමද මෙයට හේතුවූ තවත් කරුණකි.

## අපනයන කෙරෙහි බලපෑම

අපනයන පිරිසැකසුම් කලාපයක් පිහිටුවීමේ එක් ප්‍රධාන පරමාර්ථ-යක් නම් නියත විදේශීය වෙළඳ පොලක් ලබාගත හැකි ඉතා උසස් තත්ත්වයෙන් යුතුවූ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දේශීය සහභාගිත්වය සහිතව හෝ රහිතව හෝ පිළිගත් සමාගම් ලවා භාණ්ඩ නිෂ්පාදනය කරවා ගැනීමය. ඉන්දියාවේ දේශීය වෙළඳ පොලට මෙන්ම අපනයනය සඳහාද භාණ්ඩ නිෂ්පාදනය කරන සමාගම් ගණනාවක්ම එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය හා ජපානය යන රටවල ප්‍රධාන නිෂ්පාදන සමාගම් සමග බැඳීම් ඇතිකරගෙන ඇත. ඉන්දියාවේ භාණ්ඩ අපනයනය

බෙහෙවින්ම සාර්ථකවී ඇත්තේ මෙම සම්බන්ධතාවල ප්‍රතිඵලයක් වශයෙනි. මෙම පිළිවෙල අනුගමනය නොකළහොත් ශ්‍රී ලංකාවට සිය නිෂ්පාදන අපනයනය කිරීමෙහිලා එතරම් සාර්ථක ප්‍රතිඵල ලබාගත නොහැකිවනු ඇත. අපගේ අරමුණ විය යුත්තේ, කාර්මික නිෂ්පාදන අපනයන පිළිබඳ වර්තමාන මට්ටම රු. දශලක්ෂ 250 සිට රු. දශලක්ෂ 1000 දක්වා වැඩිකර ගැනීමය. උදහරණ වශයෙන් 1976 දී සම්ප්‍රදායික නිෂ්පාදන ද්‍රව්‍යයක් වන තේ විකුණුම්වලින් රු. දශලක්ෂ 2100 ක විදේශ විනිමය ලැබී ඇත.

අපනයන පිරිසැකසුම් කලාපය ක්‍රියාත්මක වීමෙන් පසුව එම කලාපයේ ආයෝජනය කරන ව්‍යාපාරිකයන් වෙන අපනයන කටයුතු සංවර්ධනය කිරීමේ ප්‍රධාන වගකීම පැවරේ. ඊට හේතුව නම් විදේශීය වෙළඳ පොළවල් ගැනද අපනයනය සඳහා භාණ්ඩ සකස්කිරීම, ඇසිරීම ගැනද අලෙවිකිරීමේ ශිල්පීය ක්‍රම ගැනද මනා අවබෝධයක් ඔවුන්ට ඇති බැවින් අපනයන සංවර්ධන අධිකාරිය වැනි නිල මට්ටමේ ආයතනවලට වඩා එතෙර වෙළඳාම දියුණු කිරීමට හැකි තත්ත්වයක ඔවුන් සිටීමයි. එසේවූවද දැනට පවත්නා අපනයන සංවර්ධන ආයතනවලට ශ්‍රී ලංකාවේ අපනයන පිරිසැකසුම් කලාපයෙන් පරිබාහිරවූ අපනයන පිළිබඳව තවදුරටත් කටයුතු කිරීමට භාර කළ යුතුය. කාර්මික සංවර්ධනයෙහි අන්තර්නම්‍ය ආකල්පය සහ ශ්‍රී ලංකාවේ සීමිත වෙළඳ පහසුකම්ද හේතු කොටගෙන කාර්මික ව්‍යාප්තිය සෑහෙන දුරට වැලකී ඇත. වර්තමාන ආදයම් මට්ටම සහ නිෂ්පාදන භාණ්ඩ සඳහා ඇති ඉල්ලුමද සලකා බලන විට, රටෙහි සම්පූර්ණ අවශ්‍යතාවන් සැපයීම සඳහා මධ්‍යම ප්‍රමාණයේ හෝ විශාල ප්‍රමාණයේ කර්මාන්තශාලා එකක් හෝ දෙකක් පමණක් ප්‍රමාණවත් වනු ඇත. රජයේ හා පෞද්ගලික අංශයේ ඇතැම් විශාල කර්මාන්තශාලාවලට සම්පූර්ණ ධාරිතාවයම යොදා ගැනීමට නොහැකිවනුයේ වෙළඳ පොල සීමිත වන බැවින් හා මෙම සීමිත වෙළඳ පොළෙහි ව්‍යාප්තිය සඳහා ඉඩකඩ නොමැති වීමය. ශ්‍රී ලංකාවේ මුදල් හා සැබෑ ආදයම් මට්ටම් ඉහළ නැඟ නැති බැවින් අභ්‍යන්තර ඉල්ලුම වැඩිකිරීම සඳහා ක්‍රය ශක්තිය පළල්වීයාමක් සිදුවී නැත. ජනයා තමවත් සිය ආදයමෙන් වැඩි කොටසක් ආහාර හා ඇඳුම් පැළඳුම් වැනි මූලික අවශ්‍යතාවන් සඳහා වැය කිරීමට පුරුදුවී සිටිති. එපමණක්ද නොව පසුගිය අවුරුදු 4–5 දක්වා කාලය තුළ උද්ධමනය ඉහළ නැග එය සැබෑ ආදයම කෙරෙහි බලපෑ බැවින් නිෂ්පාදිත භාණ්ඩ සඳහා පවතින ඉල්ලුම, වැඩිවූ මුදල් ආදයම හා සමානුපාතිකව වැඩිවී නැත.

දැනට පවත්නා රාමුව තුළ කර්මාන්ත අංශයෙහි සේවානියුක්තිය වැඩිකළ හැක්කේ, ධාරිතා උපයෝගිතාවය වැඩිකොට නැතිනම් නව කර්මාන්ත ඇතිකොට වෙළෙඳපොල විශාල කරගැනීමෙන් සහ නිෂ්පාදන මට්ටම වැඩිකර ගැනීමෙනි. ශ්‍රී ලංකා නිෂ්පාදන සඳහා ඉල්ලුමෙහි සැලකිය යුතු වැඩිවීමක් ඇතිවිය හැක්කේ දේශීය ඉල්ලුම වැඩිකර ගැනීමෙන් නොව අපනයන මට්ටම වැඩිකර ගැනීමෙනි. මෙරට දශලක්ෂ 5.2 ක් පමණ වන මුළු සේවා නියුක්තියෙන් මේ වනතෙක් පුද්ගලික හා රාජ්‍ය අංශයේ කර්මාන්ත මගින් රැකියා සපයා ඇත්තේ 150,000 කට පමණි. එනම් මුළු ප්‍රමාණයෙන් සියයට දෙකකට පමණි. නිෂ්පාදනයෙහි හා නව රැකියා උත්පාදනයෙහි කාර්මික අංශයෙන් ඉටුවුණ සේවය ඉතාමත් සීමිතවූ අතර, පසුගිය වසර කිහිපය තුළ කාර්මික සේවාවල නියුක්තව සිටි මුළු සේවක සංඛ්‍යාවෙහි එතරම් වෙනසක් සිදුවී නැත. අතිරික්ත ධාරිතාව හා බොහෝවිට අනුචිත තාක්ෂණය ව්‍යවහාර කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් කර්මාන්තවල ශ්‍රම අවශෝෂණ ධාරිතාව බෙහෙවින් අඩුවී ඇත. වර්තමාන තත්ත්වය යටතේ අපනයන පිරිසැකසුම් කලාපය විසින් උත්ප්‍රේරකයක් වශයෙන් ක්‍රියාකොට මුළුමනින්ම පාහේ නිෂ්ක්‍රිය බවට පත්ව ඇති නිෂ්පාදන අංශය කර්මණ්‍ය බවට පත්කිරීම සඳහා අවශ්‍ය ප්‍රේරණය ලබාදිය හැකිය.

මෙම කලාපයේ වැඩ කටයුතු සාර්ථකවීම හා විදෙස් ආයෝජන ඇද ගැනීමේ හැකියාව රඳා පවතිනුයේ යෝග්‍ය ප්‍රතිපත්ති හා රජය මගින් සලසන අනුග්‍රහය මතය. පාලන නීතිරීති ලිහිල් කිරීමෙන් හා වඩාත් තාත්වික වූ විනිමය අනුපාතික හඳුන්වා දීමෙන්ද ආර්ථිකය නිදහස් කිරීම නිසා ආයෝජනය සඳහා සතුටුදයක වාතාවරණයක් ඇතිවෙනවා පමණක් නොව නිලධාරි තන්ත්‍රයේ පාලනයේ බලපෑම අඩුවී තමන් විසින්ම තීරණවලට එළඹීම සඳහා වැඩි නිදහසක් ලැබීමද ආයෝජකයන් දිරිගැන්වීමට හේතුවනු ඇත. රජයේ මැදිහත්වීම ඉතාමත් අල්පවන බැවින් ආයෝජකයා තුළ විශ්වාසයක් හා ධෛර්යයක්ද හටගනී.

## කර්මාන්තවල ස්වභාවය හා බලපෑම

දේශීය කර්මාන්ත හිමියන්ට සිය කර්මාන්ත සංවර්ධනය කරගැනීමට අනුබල හා අනුග්‍රහ ගණනාවක්ම ලබාදී ඇත. එක්දහස් නමසිය හැට ගණන් හා හැත්තෑ ගණන්වල ආරම්භ කළ කර්මාන්තවලින් වැඩි ගණනක්ම වර්ධනයට හා පැවැතීමට ආධාරකවූ බදු විරාම, සංවර්ධන ප්‍රතිදම සහන හා වෙනත් අනුබලදීම් ඔවුන් විසින් ප්‍රයෝජනයට ගත් කාලය දැන් අවසන් වී ඇත. අපනයන පිරිසැකසුම් කලාපයේ ආයෝජනවලින් තමන් නැත්තටම නැතිවේය යන බියක් දේශීය කර්මාන්තකරුවන් තුළ ඇතිවී ඇත. මෙය හේතු විරහිත බියකි. මක්නිසාද යත්, රටේ අනිකුත් අපනයන කර්මාන්තවලට ලබාදී ඇති අනුග්‍රහවලට වැඩියෙන් අනුග්‍රහ අපනයන පිරිසැකසුම් කලාපයට සලසාදීම සිදුවිය නොහැකිවන බැවිනි. එැඩිම වුවහොත් ඔවුන්ට බදුවිරාමයක් සහ ශ්‍රී ලංකාවේ අනිකුත් කර්මාන්තවල මූලාරම්භ වර්ෂයේදී භුක්ති විඳි අනිකුත් සියලුම වරප්‍රසාද ඔවුන්ටද හිමිවනු ඇත. මේ හැරුණු විට අපනයන පිරිසැකසුම් කලාපය විසින් භුක්ති විඳිනු ලබන අනිකුත් වැදගත්ම වාසිය නම් නිලධාරිවාදයේ පාලන නීතිරීති හා පරිපාලන අඩාල කිරීම්වලට හසුනොවී එහි ආයෝජකයන්ට සිය කටයුතු කරගෙන යාමට හැකිවීම හා රටට සාමාන්‍යයෙන් අදාලවන රේගු කාර්ය පටිපාටියෙන්ද ඇතිවන බලපෑම් බොහෝදුරට අඩුවීමය. අපනයන පිරිසැකසුම් කලාපයේ කර්මාන්ත තරඟ කරනුයේ අනිකුත් අපනයන කර්මාන්ත සමඟ මිස දේශීය වෙළඳ පොළට භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තයන් හා සමඟ නොවේ. අපනයන කර්මාන්ත දේශීය වෙළෙඳ පොළ සඳහා භාණ්ඩ නිපදවන අනිකුත් කර්මාන්තවලට වඩා කාර්යක්ෂමය. එපමණක්ද නොව කලාපයෙහි නිපදවනු ලබන භාණ්ඩ සාමාන්‍යයෙන් මෙරට වෙළඳපොළට නොපිවිසෙන නමුදු ඒවා මෙහි අලෙවි කළහොත් සාමාන්‍ය තීරු ගාස්තු හා පිරිවැටුම් බදු ගෙවිය යුතුවේ. එමනිසා රටෙහි අනිකුත් කර්මාන්තවලට ආරක්ෂාව සැලසෙනු ඇත.

තමන් භාවිතාකරන තාක්ෂණයන්, නිෂ්පාදන ක්‍රම හා සිය නිෂ්පාදන භාණ්ඩවල කේවලත්වය නිර්ණය කරගැනීමේ නිදහස කලාපයේ ආයෝජකයන් සතුවනු ඇත. එමෙන්ම ඔවුන්ට උවමනා කවර භාණ්ඩයක් වුවද නිපදවීම ට ඔවුන්ට නිදහස ඇතැයි සැලකිය හැකිය. එතෙකුදු වුවත් එම නිෂ්පාදන සියල්ලම අපනයනය කළ යුතුවේ. කම්කරු නීති හා රෙගුලාසි වඩාත් ලිහිල්ව අදාලවනු ඇත. නිෂ්පාදන භාණ්ඩ අපනයනය සඳහා වන බැවින් නිෂ්පාදකයන් ස්ථිරවම ලෝක වෙළෙඳපොලෙහි සිය තත්ත්වය තහවුරු කර ගැනීමට නම් ඔවුන් විසින් ලොව සෙසු රටවල තාක්ෂණික අභිවර්ධනය හා කාලානුරූප විය යුතුය. කලාපය ඇතුලත යන්ත්‍ර සූත්‍රවලට ශ්‍රමිකයන් වැඩියෙන් යොදගන්නා තාක්ෂණ ක්‍රම ඒකාකාරවම භාවිතා කරනු ලැබේ යයි මින් අදහස් නොවේ. ඉලෙක්ට්‍රෝනික භාණ්ඩ, වාහන හා යන්ත්‍ර කොටස් හා රසායනික ද්‍රව්‍ය බඳුවූ නිෂ්පාදන සම්බන්ධයෙන් නව සංකීර්ණ උපකරණ ආනයනය කරනු ලැබීමට ඉඩ ඇති බැවින් මෙම කර්මාන්තවලින් සැලසෙන සේවා නියුක්තිය අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩුවනු ඇත. ඇඳුම් පැළඳුම්, භාණ්ඩ එකලස් කිරීම, රසකැවිලි නිෂ්පාදනය, ටින්කෑම ඇහිරීම හා කෘෂිපාදක කර්මාන්ත ක්ෂේත්‍රවල සේවා නියුක්තිය සඳහා සෑහෙන ඉඩ ප්‍රස්ථාව ඇත. සියඑම කර්මාන්ත සඳහා ශ්‍රමාධික තාක්ෂණ ක්‍රම උපයෝගී කර ගැනීම අපේක්ෂා කළ නොහේ.

එමනිසා කලාපය ඇතුලත කර්මාන්තවල සංකලනයක් දක්නට ලැබිය හැකිය. සමහර ඒවා නව සංකීර්ණ තාක්ෂණයන් පදනම් කර ඇති අතර අනිකුත් කර්මාන්ත ශ්‍රමාධික ඒවා වනු ඇත. එසේ වුවද මෙහි පිහිටුවනු ලබන කර්මාන්තවලින් වැඩි ගණනක්ම පිහිටුවනු ලබනුයේ අඩු වැටුප් පිරිවැයෙන් වාසි ලැබ ගැනීමට බැවින් කර්මාන්ත වැඩි ගණනක්ම ශ්‍රමාධික ක්‍රම උපයෝගී කරගැනීම හා ලාභදයක ලෙස ශ්‍රමය යෙදවිය හැකිවන ආයෝජන තෝරා

ගැනීමද කරනු ඇත. රජයේ මනාපයට ගැලපෙන කර්මාන්ත පිහිටුවීමට උපයෝගී කරගත හැකි එක් සාධකයකි මෙය. මේ පදනම මත කලාපය ඇතුලත මාස 18 කදී 50,000 කට සේවා නියුක්තිය සැලසිය හැකිවේ. බටහිර රටවල් රෙදිපිළි නිෂ්පාදනය සම්බන්ධයෙන් පනවා ඇති සලාක සීමා ගැන දැඩි ක්‍රියා මාර්ගයක් නොගන්නේ නම් වෙනත් රටවල්හි දැනටමත් නිෂ්පාදන කටයුතුවල නිරතව ඇති ඇඳුම් නිෂ්පාදකයෝ මෙහි පැමිණීමට ඉඩ ඇත. මුල් වර්ෂයේදී කලාපය තුළ ඇඳුම් නිෂ්පාදන ඒකක 10 ක් පිහිටුවුවහොත්, එමගින් මෙම කර්මාන්තවල පමණක් 30,000 හා 40,000 අතර රැකියා සංඛ්‍යාවක් ඇතිකළ හැකිවනු ඇත.

මීට අමතර වශයෙන් කලාපය තුළ ප්‍රාථමික සේවා නියුක්තිය හේතු කොටගෙන රටේ අනිකුත් කොටස්වල ඒ හා සමාන රැකියා සංඛ්‍යාවක් බිහිවනු ඇත. මේවා වැඩි වශයෙන් ප්‍රවාහණය, සන්නිවේදනය, දුන්වීම් පලකිරීම, බඩු ඇහිරීම, නඩත්තු කිරීමේ කටයුතු, ආහාර අමුද්‍රව්‍ය හා විනෝදස්වාදය සැපයුම ආදී සේවා හා සම්බන්ධ වනු ඇත. කලාපය තුළ වැටුප් හා ජීවන රටේ වෙනත් පලාත්වල වැටුප්වලට වඩා වැඩි විය හැකි අතර මෙම මුදල් කලාපය තුළ සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් විසින් මෙරටෙහිදී වියදම් කරනු ලැබේ. කඩිනමින් සිය මෙහෙයුම් ආරම්භ කිරීමට උනන්දුවක් දක්වන කර්මාන්ත විසින් රටෙහි අනිකුත් කර්මාන්තවලින් පුහුණු සේවකයන් ලබාගැනීමට තැත්කිරීමට ඉඩ ඇති නිසා එබඳු සේවකයන් බඳවාගැනීමට වැඩි වැටුප් පිරිනැමිය යුතුවේ. පුහුණු සේවකයන් කලාපය තුළට ඇදීයාමෙන් රටේ වෙනත් පලාත්වල ස්ථාපිත පැරණි ආයතනවල පුහුණු කිරීමේ හා රැකියා සැලසීමේ නව මං විවෘත වනු ඇත. මෙම කාර්යාවලියෙන් පුහුණු සේවකයන් හා මධ්‍ය කළමනාකරණ විශේෂඥ දැනුම වැඩියෙන් විසරණය වීම සිදුවනු ඇත. කලාපයෙහි අලුත් රැකියා ඇතිවීමේ බලපෑම කලාපයට පමණක් සීමා නොවී නොයෙකුත් ආකාරයෙන් රටේ අනිකුත් ප්‍රදේශවලටද පැතිර යනු ඇත.

අපනයන පිරිසැකසුම් කලාපයේ ව්‍යාපාරමය කටයුතු නිෂ්පාදනයට පමණක් සීමා නොවනු ඇත. මූල්‍ය, බැංකු හා ආනයන අපනයන වාණිජ මධ්‍යස්ථාන බඳුවූ ක්ෂේත්‍රවල නව කටයුතුවල දියුණුවත් සමඟම කලාපයේ කටයුතු ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වීමට ඉඩ ඇත්තේය. කලාපයට ලබාදෙන අනුග්‍රහ මෙම අනිකුත් ව්‍යාපාර වර්ධනය වීමට උත්තේජකයක් වනු ඇත. නැවකින් තවත් නැවකට බඩු මාරු කිරීම, ප්‍රති–අපනයනය හෝ අපනයනය සඳහා භාණ්ඩ තවදුරටත් පිරිසැකසුම් කිරීමට හෝ දේශීය වෙළඳ පොළට ඒවා රේගු ගාස්තු නොගෙවා ආනයනය කිරීම සඳහා ගෙනයාම කළ හැකිය. රේගු ගාස්තු හා වෙනත් ගාස්තුවලින් ලැබෙන සහන භුක්ති විඳීම සඳහා කලාපය ඇතුළත ක්‍රියාත්මක වන සමාගම් විසින්, භාණ්ඩ එකලස් කිරීම, නිෂ්පාදනය කිරීම හෝ විසන්ධි කළ කොටස් ගබඩා කර තැබීම යනාදී කටයුතුවලද නිරතවනු ඇත. ශ්‍රී ලංකාව ඇතුළු වෙනත් බොහෝ රටවල් ඉතාමත් අධික රේගු ගාස්තු හා බදු අයකරන බැවින් අපනයන පිරිසැකසුම් කලාපයට ආනයනය කරනු ලබන භාණ්ඩ රටෙහි අනිකුත් පළාත්වලට අදාලවන බදු අයකිරීම් ගාස්තු හා එබඳු වෙනත් රෙගුලාසිවලින් නිදහස්වනු ඇත.

## ක්‍රියාකරවුම් සීමා

අපනයන පිරිසැකසුම් කලාපය ඇතුලත ක්‍රියාත්මක වන සමාගම්වලට බදු සහන හා අනුග්‍රහ අදාලවුවද එබඳු අනුග්‍රහ රටේ සිවිල්, වාණිජ හා බැංකු නීතිවලට යටත්වනු ඇත. වාණිජ හා බැංකු සමාගම් ලියාපදිංචි කිරීම මහජන සෞඛ්‍යය, ආරක්ෂාව, දණ්ඩ නීතිය හා පරිසර සංරක්ෂණය ආදිය පිළිබඳ නීති මීට ඇතුලත්වනු ඇත. කලාපය ඇතුලත ව්‍යාපාරමය හා පුද්ගලික බදු පවා අදාලවනු ඇත. සත්කාරක රටට සෘජු ආදායම ලැබෙනුයේ පුද්ගලික බදු හා නිෂ්පාදන වෙනුවෙන් අයකරනු ලබන සුළු ප්‍රමාණයක පිරිවැටුම් බදුවලිනි. කලාපය ව්‍යාප්තවීමත් සමඟම මෙය සැලකිය යුතු ආදායම් මාර්ගයක් බවට පත්වීමට ඉඩ ඇති අතර සපයනු ලබන සේවා වෙනුවෙන් අයකරන පිරිවැටුම් බද්දෙන්ද ආදායම් ලබාගත හැකිය. කලාපයේ නිපදවන ලද භාණ්ඩ පැහැදිලිවම නියම කළ යුතු මායිම්වලින් පිටත රටේ වෙනත් ප්‍රදේශවලට යැවීමේදී එම භාණ්ඩ තීරු ගාස්තුවකට යටත් විය යුතුය. හොර බඩු ජාවාරම් හා අනවසරයෙන් බඩු වෙළඳාම් කිරීම වැලැක්වීම සඳහා කලාපයට අයත් කඩවත් සීමාවල තීරුබදු අයකිරීමේ ක්‍රමයක් පවත්වාගෙන යාම අවශ්‍ය වනු ඇත.

කලාපය ඇතුලතට විවිධ වර්ගවල භාණ්ඩ ගෙනගිය හැකි වුවද, සාමාන්‍යයෙන් සත්කාරක රට තුළට ගෙනයාමට තහනම් කර ඇති භාණ්ඩ ගෙනගිය නොහැක. සාමාන්‍යයෙන් සත්කාරක රටතුළට ගෙනයාමට තහනම් කොට ඇති මත්ද්‍රව්‍ය, අනතුරුදායක බෙහෙත් ද්‍රව්‍ය, අවි ආයුධ, වෙඩි බෙහෙත්, අගනා ලෝහ හා අනර්ඝ මැණික් ආදිය කාර්මික අවශ්‍යතාවයන් සඳහා මිස අපනයන පිරිසැකසුම් කලාපය තුළට ගෙනාගිය නොහැක. කලාපය ඇතුලතදී එහි නිපදවූ භාණ්ඩ සිල්ලරට වෙළඳාම් කිරීම් තහනම් කළ යුතු අතර, යම් හෙයකින්සිල්ලර වෙළඳාමට අවසර ලබාදුනද එය රටට සාමාන්‍යයෙන් අදාල වන රෙගුලාසිවලට යටත්වනු ඇත.

තීරුගාස්තු හා වෙනත් බදුවලින් තොරව පාරිභෝගික භාණ්ඩ මිලදී ගතහැකි නිදහස් තොටුපළක් සමඟ සංසන්දනය කොට අපනයන පිරිසැකසුම් කලාපය වරදවා තේරුම් නොගත යුතුය. සංචාරකයන්ට හා විදේශීය අමුත්තන්ට විදෙස් මුදල් ගෙවා භාණ්ඩ මිලදී ගත හැකි තීරු බද්දෙන් නිදහස් සාප්පු කිහිපයක් කලාපය තුළ තිබිය හැකිය. එපමණක් ද නොව, ව්‍යාපාරිකයන් ජ්‍යෙෂ්ඨ තාක්ෂණික, කළමනාකරණ හා විශේෂඥ නිලධාරීන් හැරුණු විට අපනයන පිරිසැකසුම් කලාපය තුළ සාමාන්‍ය ජනයාට පදිංචි වීමට ඉඩ නොදෙනු ලැබේ. සේවකයෝ සාමාන්‍යයෙන් කලාපය ඇතුලතට වැඩට පැමිණෙති. කලාපයෙන් විස්තීරණ ප්‍රදේශයක් ආවරණය නොවන බැවින්, එය තුළ වාසය සඳහා අනුබල නොදෙනු ඇත. ඉඩම් මිල අධිකවන බැවින්ද කලාපය ඇතුලත නිවෙස් ඉදිකිරීම සම්පත් අපතේ යැවීමක් වනු ඇත. එපමණක්ද නොව කලාපය ඇතුලත වෙසෙන ජන සංඛ්‍යාව අල්පවූ විට ආරක්ෂා විධිවිධාන පවත්වාගෙන යාමද පහසුවනු ඇත. කටුනායක අවට අපනයන පිරිසැකසුම් කලාපය මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්ත සඳහා වෙන්කර ඇති බැවින්, ප්‍රදේශය තුල නිවාස ඉදිකිරීමට අනුබල නොදෙනු ඇත. එසේවුවද තදාසන්න ප්‍රදේශවල නිවාස ඉදිකළ යුතුවේ.

## ආයෝජකයන්ට ලැබෙන වාසි

විදේශීය ආයෝජකයන්ට අපනයන පිරිසැකසුම් කලාපයෙන් ලබාගතහැකි ප්‍රතිලාභ බොහෝය. මෙයින් වඩාත්ම වැදගත්වනුයේ ව්‍යාපාරිකයන්ට හා වෙළඳුන්ට තීරු ගාස්තු, ආනයන බදු ගෙවීම හෝ බන්ධිත භාණ්ඩ වෙනුවෙන් අරමුදල් හිර නොකර අරමුදල් උපයෝගී කරගැනීමට ඉඩ තිබීමය. විදේශ විනිමය ලබාගැනීමෙහි දුෂ්කරතාවයක් නොවන බැවින් ඔහුට ලෝක වෙළඳ පොළෙහි අමුද්‍රව්‍ය සඳහා පවතින අඩුමිලෙන් ප්‍රයෝජන ගෙන ඒවා තොග වශයෙන් ආනයනය කිරීම කළ හැකිය. අපනයන පිරිසැකසුම් කලාපයෙහි අමුද්‍රව්‍ය පිරිපහදු කිරීමට හෝ ඒවා යළි අපනයනය කිරීම සඳහා තවදුරටත් පිරිසැකසුම් කිරීමටද කර්මාන්ත ඇතිකළ හැකිය. එබඳු අවස්ථාවලදී එකතුවූ අගයෙහි අධිකයක් ඇතිවන අතර භාණ්ඩයේ කේවලත්වය උසස්වීම නිසා වටිනාකම අනුව නොව විශේෂිත පදනමක් මත බදු අයකළ හොත් ආනයන කරන රටට නැව්කුලී හා තීරු ගාස්තු සැහෙන ප්‍රමාණයක් ඉතිරි කරගත හැකි අතර අපනයනකරුටද වැඩි මිලක් ලැබෙනු ඇත. භාණ්ඩ පැකට්කිරීම, අලෙවි කිරීම හා ලේබල් කිරීම යන කටයුතු ගනුදෙනුකරුගේ රුචිකත්වය අනුව ඉටුකිරීමට වඩාත්ම යෝග්‍ය ස්ථානය අපනයන පිරිසැකසුම් කලාපයයි. එය එක්තරා වෙළඳ පොළක් උදෙසා පිරිවිතරවලට අනුකූලව භාණ්ඩ එකලස් කිරීම හා නිෂ්පාදකයින්ගේ මධ්‍යස්ථානයක් වශයෙන්ද පවතිනු ඇත. මෙම කලාපය තොග වෙළෙඳ සැපයුම් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කළ හැකි අතර ඇනවුම් කිරීම හා භාණ්ඩ සැපයුම අතර කාලය අඩුකර ගැනීමටද උපස්ථම්භක විය හැකිය. කලාපය ඇතුලත සමාගම් සත්කාරක රටෙන් ලැබෙන ඇනවුම් බලාපොරොත්තුවෙන් ඔවුන් වෙත අමුද්‍රව්‍ය හා නිමි භාණ්ඩ තොග ගබඩාකොට තබාගැනීමේ ක්‍රමයක් යොදගත හැකි නම් කාර්යක්ෂයම හා සාර්ථක දේශීය සැපයුම් කාලසටහන් අනුව කටයුතු කළ හැකිය. අපනයන පිරිසැකසුම්

කලාපය තුළ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ අනවරතයෙන්ම ප්‍රදර්ශනය කිරීම සඳහා පහසුකම් සලසාලීමෙන් ගැනුම්කරුවන් පොළඹවා ගැනීමද කළ හැකිය. කලාපය තුළ නව නිපැයුම් නිපද වීමත් සමගම ඒවා මිලදී ගැනීම හා භාණ්ඩ පිරිවිතරවලට ගැලපෙන සේ නිෂ්පාදනය කිරීමට වගබලාගනු පිණිස විදේශීය ගැනුම්කරුවන් එහිම සිය නියෝජිත කාර්යාල පිහිටුවීමට වඩාත් කැමැත්තක් දක්වනු ඇත.

## අන්තර් ව්‍යුහය සැලසුම් කිරීම

කලාපය ඇතුලත ආයෝජනය කරන්නන්ට උපරිම සහයෝගය හා පහසුකම් ලබාදීම සඳහා සුනම්‍ය ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවුවහොත් අපනයන පිරිසැකසුම් කලාපයෙන් සැලකිය යුතු ප්‍රතිඵල නෙළාගත හැකි බව වෙනත් ආසියාතික රටවල අත්දැකීම් වලින් පෙනී යයි. කලාපයේ පරිපාලනය ස්වතන්ත්‍ර අධිකාරියකට පැවරිය යුතුය. කඩිනමින් අන්තර් ව්‍යුහය සැලසීම සහතික කිරීම පිණිස කලාපයේ බලාධිකාරයට අනිකුත් සංවිධාන අභිබවා කටයුතු කිරීම සඳහා අවශ්‍ය බලතල පවරාදිය යුතුය. මෙම අධිකාරි යට සාමාන්‍යයෙන් රාජ්‍ය සංස්ථාවලට මුහුණ පෑමට සිදුවන බාධක වලින් අවහිරයක් නොතිබිය යුතුය. නිලධාරි තන්ත්‍රයේ සීමා කිරීම්වලින් තොරව කටයුතු කිරීමට හා කිසිදු අවහිරයක් නොමැතිව තීරණවලට එළඹීමටද ප්‍රමුඛතා පදනමක් මත අනිකුත් රජයේ දෙපාර්තමේන්තු හා ආයතන මගින් ඉටුකළ යුතුවන කටයුතු කරවා ගැනීමටද ඉඩකඩ තිබිය යුතුය. කලාපයේ සාර්ථකත්වය වැඩි වශයෙන්ම රඳා පවතිනුයේ මූලික අන්තර් ව්‍යුහයේ තත්ත්වය හා එමගින් සැලසිය හැකි උපයෝගී සේවා මතය. කලාප අධිකාරිය විසින් ආයෝජනයට අදාල දත්තයන් හා අනිකුත් තොරතුරු පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ප්‍රස්තුත ආයෝජකයාට ලබාදිය යුතුය. රටෙහි ධනායෝජනය පිළිබඳ මුදල් රෙගුලාසි හා අනිකුත් විස්තර දැක්වෙන ලේඛනද ඔවුන්ට සැපයිය යුතුය.

ජාත්‍යන්තර පුද්ගලික ආයෝජනය අද ඉතාමත් තරඟකාරී තත්ත්වයක පවතින අතර දේශීය වාතාවරණය අනුව අතිශයින්ම වෙනස්වන සුළුය. විදේශීය ආයෝජකයාට සාමාන්‍යයෙන් විකල්ප කිහිපයක් ඇත. එමනිසා වඩාත් උත්කෘෂ්ඨ තත්ත්වයක් යටතේ සිය කර්මාන්ත පිහිටුවීමට ඔහු වැඩි රුචිකත්වයක් දක්වනු ඇත. අධිකාරිය විසින් එබඳු උත්කෘෂ්ඨ තත්ත්වයන් ඇතිකරලීමට යත්න දැරිය යුතුය. කලාපයේදී සලසනු ලබන සේවා වෙනත් ස්ථානවල ඇති ඒවාට වඩා තත්ත්වයෙන් උසස්විය යුතුය. කලාපය තුළ උසස් තත්ත්වයේ සේවාවක්වත් ඔවුන්ට නොලැබේ නම්, ආර්ථිකයේ දක්නට ඇති දුෂ්කරතා හා අහිතකර තත්ත්වයන්ද නොතකා විදේශීය ආයෝජකයන් ශ්‍රී ලංකාවට පැමිණෙතැයි සිතිය නොහේ.

අපනයන පිරිසැකසුම් කලාපයේ සාර්ථකත්වය හා විදේශීය ආයෝජකයන් ඇද ගැනීමේ හැකියාව රඳා පවතිනුයේ කලාපය පිහිටුවීමට තෝරාගන්නා ප්‍රදේශය සහ එහි සකස් කිරීම මතය. ආයෝජකයන් විසින් ආර්ථික ප්‍රතිපත්තිය හා කලාපයේ සාමාන්‍ය වාතාවරණයද සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කරනු ලැබේ. ඔවුන් වෙනත් රටවල පිරිනමා ඇති පහසුකම් සමඟ කලාපයේ වාසි හා අවාසි සන්සන්දනය කර බලනු ඇත. ඔවුන් මූලාරම්භයේදී කලාප යට අදාල ප්‍රතිපත්තීන් පමණක් නොව, විදේශීය ආයෝජන පිළිබඳ රජයේ ආකල්පය හා විදේශීය ආයෝජකයාට සලසනු ලබන ආරක්ෂා විධාන කවරේදැයි දැක්වෙන මූලික ප්‍රතිපත්ති ප්‍රකාශන යක්ද බලාපොරොත්තු වනු ඇත. කලාපයට අනුබලදීම සඳහා එතරම් පුළුල් ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළ යුතුය. මෙරට ආර්ථික කටයුතුවලට, මුදල් කටයුතු පිළිබඳ ප්‍රධාන පෙළේ විදේ ශීය සඟරාවල සැලකිය යුතු ප්‍රචාරයක් ලබාදී නැත. ප්‍රචාරයෙන් තොරව ජාත්‍යන්තර මට්ටමෙහි ආයෝජකයාට ශ්‍රී ලංකාවෙන් පිළිගැන්වෙන දෑ පිළිබඳව අවබෝධයක් ලබාගත නොහැකිවාක් මෙන්ම එබඳු ප්‍රචාරක කටයුතු කල්වේලා ඇතිව ආරම්භ කළ යුතුද වේ.

සුපරීක්ෂාකාරීව අන්තර් ව්‍යුහය සැලසුම් කළ යුතු අතර, ආරම්භයේදී පමණක් නොව, පසුවද අවශ්‍යතා ගණනාවක්ම සපුරා ලිය යුතු බැවින් කලාපය සඳහා නියමිත ප්‍රදේශය වාසි සහගත අන්දමින් පිහිටුවිය යුතු වූවක් මෙන්ම පැහැදිලිව මායිම් සලකුණු කළ ප්‍රදේශයක්ද විය යුතුය. වගුරු නොමැතිව නිසි ජලවහනය ඇති ප්‍රදේශයක්ද විය යුතුය. ප්‍රධාන මංමාවත්වලට පහසුවෙන් පිවිසිය හැකිවිය යුතුය. තදසන්න ප්‍රදේශවල නිවාස කොලනි හා උප නගර සඳහා ඉඩකඩ තිබිය යුතුය. නැව් තොටවල් හා ගුවන් තොටුපළවලටද සංනිවේදන මධ්‍යස්ථානවලටද පහසුවෙන් ළඟා විය හැකි මාර්ග තිබිය යුතුය. මූලාරම්භක අදියරයන්හිදී එතරම් ඉඩකඩ අවශ්‍ය නොවුවද මුල් මාස 12 හා 18 අතර කාලසීමාවේදී කර්මාන්තශාලා 30 සිට 40 පමණ දක්වා ක්‍රියාත්මක කිරීමට ඉඩ ඇතැයි අනුමාන කළ හැක. මුලදී අක්කර 500 ක පමණ බිම් ප්‍රමාණයක් අවශ්‍ය විය හැකි නමුදු අනාගත ව්‍යාප්තිය සඳහා තවත් අක්කර 1500 ක් පමණ වෙන්කළ යුතුය.

කලාපයේ භෞතික සැලසුම් කිරීම පුද්ගලික අංශයට නැතහොත් රජයේ දෙපාර්තමේන්තුවලට පැවරිය යුතුද යන්න රජය මුලදීම තීරණය කළ යුතුය. නොකඩවා විදුලි බලය හා ජලය සැපයුම හා කාර්යක්ෂම විදුලි සන්දේශ සේවා නොමැතිකම දිවයින පුරා පුද්ගලික කර්මාන්තකරුවන්ට මුහුණ පෑමට සිදුව ඇති ප්‍රශ්නයකි. මෙම සේවා තුනටම උසස්ම ප්‍රමුඛත්වයක් ලබාදිය යුතුව ඇත. උපස්ථිත විදුලිබල ජනක යන්ත්‍ර නොමැතිව කර්මාන්තශාලා ක්‍රියාත්මක කරවිය හැකිවන අන්දමට විදුලිබල සැපයුම සතුටුදායක විය යුතුය. කර්මාන්ත සඳහා පමණක් නොව කලාපය අවට පිහිටි නිවාස ජනපදවලට ජලය සැපයුම සඳහා ස්ථිර ජල පවිත්‍රීකරණ යෝජනා ක්‍රමයක්ද ඇතිකළ යුතුය. කලාපය කටුනායක පිහිටවනු ලැබේ නම් කොළඹ ජල සැපයුම් ක්‍රමයෙන් කොළඹ හා කලාපයේ අවශ්‍යතාවයන් පිරිමසාලිය නොහැකි බැවින් කලාපයේ ජල සැප යුම කොළඹ ජල සැපයුම් ක්‍රමයට සම්බන්ධ නොකළ යුතුය. කලාපයේ ජලය සැපයුම කැළණි ගඟට සම්බන්ධ කළ තනි පවිත්‍රී කරණ පිරියතක් මගින් ලබාදීමට පියවරගත යුතු අතර එය ගඟෙහි උතුරට බර ස්ථානයක පිහිටුවිය යුතුය.

කර්මාන්තශාලා, ගොඩනැගිලි හා පිරියත් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් හා ස්ථාපනය කිරීමේ කටයුතු පිළිබඳව විදේශීය ආයෝජකයන් විසින් නියම කර ඇති කෙටි සීමා ඇතුලත ඒවා නිමකිරීම සඳහා සේවා ගණනාවකටම සූදානම්ව සිටිය යුතුය. සිය රටවල නව සංකීර්ණ නිර්මාණාත්මක තාක්ෂණයන්ට පුරුදු වී ඇති ආයෝජකයන් ශ්‍රී ලංකාවේ අනුගමනය කරනු ලබන ශ්‍රම හා ඉදිකිරීම් කටයුතු කෙරෙන සුනංගු වේගයට නුපුරුදු අය විය හැකිය. මේ නිසා ඉදිකිරීම් සමාගම්, විශේෂයෙන් පුද්ගලික සමාගම් විදේශීය ආයෝජකයන්ගේ නියත අවශ්‍යතාවයන් සපුරාලීමට සූදානම් විය යුතුය. වැඩ සටහන ක්‍රියාත්මක කරගෙන යන අතරතුර ඉදිකිරීමේ අදියරෙහිදී හා පසුවත් කලාපය ඇතුලත කර්මාන්ත සඳහා ඇතැම් පුහුණු ශිල්පීන්ගේ හිඟයක් ඇතිවීමට ඉඩ තිබේ. තාක්ෂණික ශිල්පීන් හා පුහුණු සේවකයන් මැද පෙරදිගට සංක්‍රම ණයවීම හේතුකොටගෙන කලාපයේ කර්මාන්ත සඳහා අවශ්‍ය කෞශල්‍යය අවශ්‍යතා පිරිමසාගැනීම සඳහා සෑම වර්ගයකටම අයත් තාක්ෂණ ශිල්පීන් හා මධ්‍යම කළමනාකරණ ශ්‍රේණිවල සේවක කොටස් පුහුණු කරවීමට යෝජනාක්‍රම දියත් කළ යුතුව ඇත.

ඇතැම් ලුහු කාර්මික අමුද්‍රව්‍යවලින් කොටසක් ගුවන් මගින් ගෙන්වා ගත හැකිවුවද කලාපයේ කර්මාන්ත සඳහා අවශ්‍ය උප කරණ හා අමුද්‍රව්‍ය වැඩි කොටසක් කොළඹ වරාය හරහා මෙහි ගෙන්වාගත යුතුව ඇත. මේ සම්බන්ධයෙන් ස්ථාන දෙකකදී කාර්යක්ෂම ලෙස කටයුතු කිරීම අවශ්‍ය වේ. එක් අතෙකට අමුද්‍රව්‍ය කොළඹ සිට ගෙන ඒම සඳහාද අනික් අතට කටුනායක සිට නිමි භාණ්ඩ ගෙනයාම සඳහාද කාර්යක්ෂම පරිවහන ක්‍රමයක් තිබිය යුතුය. මීට වඩා වැදගත් කාර්යය නම් කලාපයේ අවශ්‍යතා පිරිමසාලීම උදෙසා කොළඹ වරායද කර්මණ්‍ය බවට පත්කිරීමය. කොළඹ වරාය දැන් සංවිධානය කර ඇති අන්දමට එයට කලාපයේ අවශ්‍යතා සපුරාලීමට පුළුවන්කමක් නැත. කම්කරු ගැටළු හා අකාර්යක්ෂම කළමනාකරණය හැරුණු විට, වරායේ නැව් ලැගුම් ගැනීමේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හා බඩු පැටවීමේ හා බෑමේ පහසුකම්ද අසතුටුදායක තත්ත්වයක පවතී. අවිච්ඡින්න පදනමක් මත කලාපය දක්වා සහ කලාපයෙන් පිටතට පරිවහනය

කෙරෙන භාණ්ඩ පිළිබඳව කටයුතු කිරීම උදෙසා අතිරේක ගුදම් ඉඩකඩ සැපයිය යුතුය. එපමණක්ද නොව කලාපය වඩ වඩා වර්ධනය වීමේදී බහුවලින් වැඩි කොටසක්ම ඇසුරුම්වල බහාලූ ආකාරයෙන් වරායට ගෙන ඒම හෝ ඉන් ගෙන යාම හෝ සිදුවිය හැකි වුවද කොළඹ වරායෙහි ඇසුරුම්වල යෙදූ නැව් භාණ්ඩ සඳහා ලැගුම් පහසුකම් නැත. මෙම සියලුම කාර්යයන් සඳහා වරායේ පහසුකම් වැඩි දියුණු කිරීම අවශ්‍ය වන අතරම, ආයෝජකයින් තුළ මෙරට ආයෝජන කිරීම සම්බන්ධයෙන් බිය සැක පහළ නොවන අන්දමට මෙම සංවර්ධන කටයුතු කල් ඇතිව සම්පූර්ණ කළ යුතුය. නොඑසේ නම් අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ පරිවහනය සඳහා හොඳ ප්‍රවාහණ පහසුකම් නොමැතිවීම නිසා තමන් ලොකු අමාරුවක වැටේ යයි ආයෝජකයෝ ඒකාන්තයෙන්ම කල්පනා කරන්නාහුය.